# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
# උතුරු මැද පළාත - අනුරාධපුර

මෙම අධිකාරියේ සිවිල් ඉංජිනේරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා තම අයදුම්පත් 2025.05.30 දිනට පෙර පහත ලිපිනය වෙත යොමු කරන මෙන් දන්වමි.

## ඉංජිනේරු (සිවිල්) – II ශ්‍රේණිය

**01. ශ්‍රේණිය හා වැටුප් පරිමාණය** – II ශ්‍රේණිය - 96,650-10×2,480-15×3,450-173,200 - MM 1 – 3 (2025) (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 01/2025)

**බාහිර අයදුම්කරුවන්**

(පහත සුදුසුකම් 01 හෝ 02 හෝ 03 හෝ 04)

**අවම සුදුසුකම් හා සේවා අවශ්‍යතා**

01. සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය/ නිර්මාණ/ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

02. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය/ නිර්මාණ/ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ඉංජිනේරුවෙකු ලෙස අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

04. විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව රජයේ කාර්මික නිලධාරී විභාගයේ (GTO) III කොටස සමත්, උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ (උ.මැ.ප.) විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරියෙකු වීම.

**සමඟ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය/ නිර්මාණ/ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වෙනත් සුදුසුකම් හා කොන්දේසි**

➢ අයදුම්කරුවන් බඳවා ගන්නා දිනට අදාළ සුදුසුකම් සියලු ආකාරයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.

➢ බඳවා ගන්නා දිනට වයස අවුරුදු 45ට වඩා අඩුවිය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය පූර්ව රාජ්‍ය ආයතනයක (සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

➢ රාජ්‍ය සේවා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු /සංස්ථා/මණ්ඩල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

➢ අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස්කර එවිය යුතු අතර, තමා පිළිබඳව තොරතුරු ලබාගත හැකි දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.

➢ මෙම තනතුර හුදෙක් කොන්ත්‍රාත් පදනම මත වන අතර, වසරක කාලයක් සඳහා වේ. එහෙයින් අධිකාරියේ අභිමතය පරිදි මෙම කාලය දීර්ඝ කිරීම හෝ නොකිරීම සිදුකළ හැක.

➢ බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව 03කි.

➢ මෙම කොන්ත්‍රාත් තනතුර සඳහා මාසිකව රු.92,943.00 (75,143.00 + 17,800.00) ක දීමනාව ඇතුළුව අධිකාරිය මඟින් ගෙවනු ලබන මාසික දීමනාව ද ගෙවනු ලැබේ.

➢ අයදුම්කරුට විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඇත්තේ නම් ඒවා සැලකිල්ලට ගෙන ඉහළ ශ්‍රේණියක හෝ යම් ශ්‍රේණියක වැටුප් පරිමාණයෙහි සුදුසු වැටුප් පියවරයක තබනු ලැබේ.

➢ ස්ථිර පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේදී කොන්ත්‍රාත් පදනම මත කරනු ලැබූ සේවය පිළිබඳ කාර්යක්ෂමතාවය සලකා බලනු ලැබේ.

ඔබ මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් උතුරු මැද පළාතේ කවර ප්‍රදේශයක හෝ ඔබගේ සේවය සැපයීමට බැඳී සිටී. බඳවා ගැනීමේ අවසාන තීරණය අධිකාරියේ සාමාන්‍යාධිකාරී සතුය.

**සාමාන්‍යාධිකාරී,**
**උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**එච්.බී. සේමසිංහ මාවත,**
**අනුරාධපුර.**